# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2022 මැයි 24

**මාධ්‍ය නිකුතුව**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මූල්‍ය සහ නීති උපදේශකයින් පත් කිරීම**

2022 මාර්තු මාසයේදී, ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ එහි බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් සමඟ ස්වෛරී ණය සේවාකරණයේ ඉදිරි මාවත සහ එවැනි වගකීම් යම් කාල සීමාවකට කල් දැමීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා ආරම්භ කිරීමට තීරණය කළේ ඉතිහාසයේ රට මුහුණ දී සිටින දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහාය.

ඉන් අනතුරුව, 2022 අප්‍රේල් මාසයේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය දක්වන ආර්ථික ගැලපුම් වැඩපිළිවෙලකට අනුකූල වන පරිදි වගකීම් විධිමත්ව සහ එකඟතාවයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අන්තර්කාලීන කාලයක් සඳහා විදේශ රාජ්‍ය ණය සේවා සැපයීම අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. රටේ විදේශ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ණය ආපසු ගෙවීමේ කාලසටහන තිරසාර මට්ටමකට ප්‍රතිසංවිධානය කිරීම සඳහා එහි ණයහිමියන් සමඟ එකඟතාවකට පැමිණීමට අවශ්‍ය වන අතර මේ සඳහා ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර මූල්‍ය හා නීති උපදේශකයින්ගේ සේවය ලබා ගැනීමට රජය තීරණය කළේය.

ඉහත සන්දර්භය තුළ, විදේශ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමේදී ස්වෛරීවරුන්ට අදාළ සේවාවන් සැපයීමේ ප්‍රවීණත්වය ඇති ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර මූල්‍ය හා නීති උපදේශකයින්ගෙන් යෝජනා ඉල්ලා මුදල් අමාත්‍යාංශය යෝජනා සඳහා ඉල්ලීම් (RfP) ඉදිරිපත් කළේය.

ජාත්‍යන්තර මූල්‍ය සහ නීති උපදේශකයින් තෝරා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද මෙහෙයුම් කමිටුව, බහුපාර්ශ්වික නියැලීම සහ ණය තිරසාරභාවය පිළිබඳ ජනාධිපති උපදේශක කණ්ඩායම සමඟ අවශ්‍ය අවස්ථාවලදී සාකච්ඡා කර අදාළ සාධාරණ සහ කලින් තීරණය කරන ලද නිර්ණායකවලට අනුකූලව විවෘත තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදු කර ඇත. ඒ අනුව ලංසුකරුවන් අතරින් ඉහළම ඇගයීම් ලකුණු ලබාගත් M/s Clifford Chance LLP සහ M/s. Lazard, France පිළිවෙළින් නීති උපදේශක සහ මූල්‍ය උපදේශක සඳහාතෝරාගෙන ඇත.

අමාත්‍ය මණ්ඩලය, 2022 මැයි 23 වැනි දින පැවති රැස්වීමේදී, නීති උපදේශක කොන්ත්‍රාත්තුව M/s Clifford Chance LLP වෙත ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දෙන ලද අතර, M/s. Lazard, France වෙත මූල්‍ය උපදේශක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අනුමැතිය ලබාදෙන ලදි. රජය M/s Clifford Chance LLP සහ M/s. Lazard, France සමග මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ගිවිසුම්ගත වීමට නියමිතය.